# වියලි කලාපීය ජනපද කරණය:
# වත්මන් ස්ථාවරය හා අනාගත ප්‍රවනතා

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂිකර්ම සැළසුම් හා අගැයීම් අංශයේ ප්‍රධාන

**ආචාර්ය රංජිත් දි. වනිගරත්න විසිනි.**

ශ්‍රී ලංකාවේ ගොවි ජනපද පිහිටුවීම ආරම්භ වී දැනට අඩ සියවසකට වැඩි කාලයක් ගත වී ඇත. මෙම පිළිවෙත ආරම්භ කිරීම සඳහා 1927 සිට 1929 කාලය තුල ඇති කළ 'ඉඩම් කොමිසම' මගින් නිර්දේශ කර තිබූ ජනපද ප්‍රතිපත්ති සහ රජයේ ඉඩම් මහජනයා අතර බෙදා දීමේ සංකල්ප මේ දක්වා විශාල වෙනසකට පත්වී නැතත් ජනපද ඇති කිරීමේ අභිමතාර්ථයන් හා සම්බන්ධ ප්‍රායෝගික ක්‍රියාවලිය නම් වෙනස් වීම් වලට භාජනය වී තිබේ. ජනපද පිහිටුවීම මගින් කෘෂි ආර්ථිකය තුළ ඇති වූ ප්‍රවනතා ජනපදිකයින්ට පමණක් නොව සමස්ථයක් ලෙස මුළු රටටම බලපාන හෙයින් එම ක්‍රියාවලියේ සිදුවූ වෙනස්කම් සහ ජනපදිකයින් අද සිටින ස්ථාවරය මෙන්ම මුහුණ දෙන ගැටළු ගැනද සාකච්ඡා කිරීම කාලෝචිත යැයි හැඟේ.

## 1. ජනපද ප්‍රතිපත්ති හා සැළසුම්

ආරම්භක කාලයේ (1930 දශකයේ) සිට අද දක්වා ශ්‍රී ලංකාවේ වරින් වර බලයට පත් වූ ආණ්ඩුවල රජය සතු ඉඩම් හා ඒවා පරිහරණය සම්බන්ධ ප්‍රතිපත්ති බොහෝ විට ඒ ඒ අවස්ථාවල රටේ ආර්ථිකය මත බලපෑ විශේෂිත ගැටළු අනුව වෙනස් වී ඇති බව පෙනී යයි. එසේ වුවද, සමස්ථයක් වශයෙන් මෙම ප්‍රතිපත්ති සියල්ලම ක්‍රියාත්මක වන්නේ 1927 – 1929 අතර කාලය තුළ දී පැවැත් වූ ඉඩම් කොමිසම් නිර්දේශයන් හා අභිලාෂයන් මත බව පැහැදිළිය.

මෙම කොමිසම බිහිවූයේ එවකට ව්‍යවස්ථාදායක සභාවේ කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කළ ඊ. ඩබ්ලිව්. පෙරේරා, ලංකා ආණ්ඩුකාර ධුරය දැරූ ශ්‍රීමත් හියු ක්ලිපර්ඩ්, මහාමාන්‍ය ඩී. ඇස්. සේනානායක ඇතුළු ප්‍රභූන් පිරිසකගේ උත්සාහයන් නිසාය. තෙත් කලාප ප්‍රදේශයන්හි පැවැති ඉඩම් හිඟකම, ජන ගහන තදබදය, රක්ෂා විරහිත බව හා සම්බන්ධ දුගී බව තුනී කර ලීමේ මඟක් ලෙස රජයේ ඉඩම් බෙදා දිය යුතු යයි ඔවුහු තරයේ ප්‍රකාශ කළහ. තෙත් කලාපය තුළම ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර ආරම්භ කිරීමෙන් ජනගහන තදබදයට ලක් වූ ගැමියනට අවට ප්‍රදේශ වලින් නිවෙස් තනා ගැනීමට ප්‍රමාණවත් බිම් කොටස් ලබා දිය යුතු යැයිද අදහස් කෙරිණ. මේ හැරුණු විට වියලි කලාපයේ කෘෂි ජනපද ආරම්භ කර එමගින් තෙත් කලාපීය දුප්පත් ජන කොටස් යළි පදිංචි කළ යුතු යයිද එම යෝජනාවෙන් කියැවිණ.

ඉඩම් කොමිසම මෙම අදහස් මත රජයේ ඉඩම්වල ජනයා පදිංචි කිරීමෙන් ඇතිවෙන වාසි අවාසි ගැඹුරු නිරීක්ෂණයකට භාජනය කළේය. ජනපද යෝජනා ක්‍රමයන් සඳහා ජනපදිකයින් තෝරා ගන්නා ආකාරය, එක් ජනපදිකයෙකුට දිය යුතු (ගොඩ – මඩ) ඉඩම් ප්‍රමාණය, එවැනි ඉඩම් ලබා දීමේ අරමුණු, ඉඩම් ලාභීන් පොලී කරුවන් වැනි කූට පුද්ගලයන්ගෙන් ආරක්ෂා කර ගැනීමත්, ඉඩම් කැබලි වීම වැලැක් වීමත්, ඉඩම් උපරිම ලෙස අදල කාර්යය සඳහාම යෙදවීමට ගතයුතු පියවර හා එබඳු ඉඩම් පාලනය කිරීමට බිහි කළ යුතු පරිපාලන ඒකක ආදී කරුණු රාශියක් මෙම කොමිසමේ විමර්ශනයට ලක් විය.

මේ පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව බෙදා දෙන රජයේ ඉඩම් වල අයිතිය සින්නක්කරව ගොවීන්ට පැවරීම නුසුදුසු යැයි කොමිසමේ නිර්දේශයක් විය. ඊට හේතුව ඉඩම් නොමැති දුප්පත් ජනතාවට ලබාදෙන මේ ඉඩම් පසු කලකදී පොළියට ණය දෙන්නන්, වෙළෙන්දන් හා වෙනත් ධනවතුන් අතට පත්වේ යැයි කොමිසම තුළ බියක් ඇතිවීම නිසාය. එනිසා සින්නක්කර අයිතිය වෙනුවට 99 අවුරුදු බදු ඔප්පුවක් යටතේ ඉඩම් බෙදා දිය යුතු යයි නිර්දේශ කරන ලදී. එම බදු ඔප්පුව යටතේ ඉඩම පරිහරණය කිරීමේ අයිතිය එය දියුණු කිරීම හා එයින් ලබන ආදයම (සුළු ඉඩම් බද්දක් හැර) ගොවීන් අතට පත් වී එය ඔවුන්ගේ ආර්ථික දියුණුවටම යෙදවීමට ගොවීනට හැකියාව සළසා තිබිණ.

කොමිසමේ තවත් ප්‍රධාන බලාපොරොත්තුවක් වූයේ පසු අයිතිය නිසා ඇති වන ඉඩම් කැබලි වී යාම වැලැක්වීමයි. මේ අනුව බෙදන ලද ඉඩම් වල පසු අයිතිය, බදු ඔප්පුව ලද ගොවියා නම් කරන එක් අයෙකුට පමණක් හිමි විය යුතු යැයි නිර්දේශ කරන ලදී. මේ හැර ඉඩම් විකිණීම, බද්දට දීම, උගස් කිරීම ආදිය තහනම් කළ යුතු යැයි ද නිර්දේශ විය.

ඉඩම් කොමිසමේ ඉහත කී නිර්දේශයන් මගින් පැහැදිළි වන්නේ මහජනයා අතර බෙදා දෙන ඉඩම් වල ප්‍රධාන අයිතිය රජය මතම තබා ගත යුතු බවයි. එයට හේතු වශයෙන් කොමිසම දැක්වූයේ රටේ අනාගත ආර්ථිකය හා ජනගහන අවශ්‍යතා වෙනස් විය හැකි හෙයින් එවැනි වෙනස් වීම් වලට අනුකූල භූමි පරිභෝජන සැලසුම් සමඟ අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට හැකි වන බවය. තවද 99 අවුරුදු බදු ඔප්පු වලින් ඉඩම් ලාභීන් ලබන අයිතිය සීමිත එහෙත් දීර්ඝ කාලීන ලෙස එම ඉඩම් පරිභෝජනය කිරීමට එය විශේෂ බාධාවක් නොව රුකුලක් බවද කොමිසම විශ්වාස කළේය.

1927 – 29 ඉඩම් කොමිසමේ පසුබිම් බලාපොරොත්තුව වූයේ, ශ්‍රීමත් හියු ක්ලිපර්ඩ් ආණ්ඩුකාරතුමා පැවසූ පරිදි සුරක්ෂිත භුක්තියක් යටතේ ඉඩම් නැති දුප්පත් පවුල් අතර රජයේ ඉඩම් බෙදා දීමෙන් ''ආර්ථික වශයෙන් දියුණු වූ, ස්ව ශක්තියෙන් යුත්, ඉඩම් හිමි ආදර්ශවත් ගොවි පවුල් සමූහයක්'' රට තුළ බිහි කිරීමය. එහි අදහස වූයේ යැපුම් මට්ටමේ කෘෂි පන්තියක් බිහි කිරීම නොව වෙළඳ පොළ සඳහා නිෂ්පාදන

ඉදිරිපත් කරන දියුණු තත්ත්වයක සිටින ගොවිජන පංතියක් එම ජනපද තුළින් ජනනය කිරීමයි.

කොමිසම් හා එයට මුල් වූ ප්‍රභූන් ඉදිරිපත් කරන ලද යථෝක්ත අදහස් හා නිර්දේශ 1935 දී ව්‍යවස්ථා දායක සභාවේ අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත මගින් නීතිගත කරන ලදී. 1931 දී ඩොනමෝර් කොමිසමේ නිර්දේශ වලට අනුව ජාතික ව්‍යවස්ථාදායක සභාව මගින් කෘෂිකර්ම හා ඉඩම් සම්බන්ධ විධායක කමිටුවක් ආරම්භ කරන ලදී. එහි සභාපති වූ මහාමාන්‍ය ඩී. ඇස්. සේනානායක මැතිතුමා කෘෂිකර්ම හා ඉඩම් ඇමති වශයෙන් පත් වූ අතර එතුමාගේ අනුග්‍රහය යටතේ 1935 අංක 18 දරණ ඉඩම් ප්‍රතිසංස්කරණ පනත හා 1939 දී "රක්ෂිත හා උපදේශික ජනපදකරණයක් (Protected and Guided Colonisation) උදෙසා 'නව පිළිවෙතක්' නීති ගත කරන ලදී. මෙම නව පිළිවෙත යටතේ ජනපදිකයන්ගේ අභිවෘද්ධිය තකා නිවෙස් තනා දීම හා වෛද්‍ය, අධ්‍යාපන, කෘෂි සේවා හා වෙනත් ආධාර සැපයීම ආදී පහසුකම් රාශියක් සලසා දෙන ලදී. තෙත් කලාපයේ සිට වියළි කලාපයට දිළිඳු ජනතාව සංක්‍රමණය කරවීමේ අභිලාෂය මෙම පහසුකම් ලබා දීමට තුඩු දුන් ප්‍රධාන හේතුවක් විය. මේ හැර එම අවධියේ දී වියළි කලාපීය ජනපද වල බෙදූ ඉඩම් ඒකකවල ප්‍රමාණයන් විශාල විය. ගොඩ අක්කර 3 හා මඩ අක්කර 5 ක් සහිත අක්කර 8 ක කට්ටි වශයෙන් බෙදා දෙන ලද ඉඩම් මගින් මිශ්‍ර කෘෂි ආර්ථිකයක් ජනපද තුළ ඇතිකර ලීමට අපේක්ෂා කරන ලදී. මෙලෙස විශාල ඉඩම් කොටස් ලබාදීමට තුඩුදුන් තවත් හේතුවක් වූයේ වියළි කලාපයට සංක්‍රමණය වීමට ජනතාව තුළ උද්යෝගයක් ඇති කිරීමේ අපේක්ෂාවයි.

තෙත් කලාපය තුළ ජන ගහන තදබදය හා සම්බන්ධ ආර්ථික ප්‍රශ්න ක්‍රමයෙන් උත්සන්න වෙමින් පැවතුන අතර වියළි කලාපයට සංක්‍රමණය වීම සඳහා ලබා දුන් පහසුකම් නිසා 1935 ට පසු ක්‍රමයෙන් වියළි කලාපීය වාරිපෝෂිත ජනපද වල පදිංචි වීමට කැමති ජන ගහනය වැඩි වීමත් සමග ජනපද ප්‍රමාණය ද ක්‍රමයෙන් වැඩි විය. 1920 සිට 1939 කාලය තුළදී අක්කර 33,385 ක ජනපද භූමි ප්‍රදේශයක ගොවි පවුල් 5,596 පදිංචි කරවන ලදහ. 1939 – 1945 කාලය තුළ ජනපද භූමි ප්‍රමාණය අක්කර 47,004 දක්වා 40% කින් වැඩි විය. 1955 වන විට අක්කර 80,588 වූ ජනපද භූමි ප්‍රමාණයක ගොවි පවුල් 12,000 ක් පමණ පදිංචි වී සිටියහ. මෙම අක්කර ප්‍රමාණයෙන් 62% වාරිපෝෂිත කුඹුරු ඉඩම් සේ ගැනේ. 1920 සිට 1955 කාලය තුළ වියළි කලාපීය ජනපද, ආරම්භ කිරීම උදෙසා රජය මගින් රු. 27,7,56,820 නැතහොත් සෑම ජනපදික පවුලක් සඳහා රු. 2,313 පමණ ආයෝජනය කර තිබිණි.

දෙවන ලෝක යුද්ධයට පසු කාලයේ ක්‍රමයෙන් වර්ධනය වූ ප්‍රශ්න රාශියකට ලංකාවට මුහුණ පාන්නට සිදුවූ නිසා ජන ගහනය වැඩි වීම හා ආහාර නිෂ්පාදනයේ ඌණතාවයන්, ගෙවුම් ශේෂ හිඟතාවයන් හා විදේශ විනිමය ඉපයීමේ අසීරුකම් ආදී ප්‍රශ්න ක්‍රමයෙන් වැඩි වූ අතර සමාජ සුභසාධනය සඳහා විශාල ආයෝජනයක් දැරීමට ද රජයට සිදු විය. මේ නිසා නොයෙක් වර වැය අංශය කපා හැරීමට රජයට සිදු වූ අතර 1939 සිට ආරම්භ කරන ලද "නව පිළිවෙත" යටතේ වියළි කලාපයේ ජනපද වලට ලබා දුන් ආධාර ද ක්‍රමයෙන් අඩුකර ලීමට සිදුවිය.

මේ අනුව 1950 ට පසු රජයෙන් බලාපොරොත්තු වූයේ අඩු වියදමකින් පෙරට වඩා විශාල ජන කොටසක් ජනපද භූමි තුළ පදිංචි කර වීමයි. මේ අනුව බෙදා දුන් ඉඩම් කට්ටි වල ප්‍රමාණය ක්‍රමයෙන් අද පවතින අක්කර $2\frac{3}{4}$ (මඩ අක්කර 2 1/2 ගොඩ අක්කර 1/4) දක්වා අඩු කරන ලදී. 1950 ට පෙර බෙදා දුන්, විශාල ඉඩම් කට්ටිවල (අක්කර 8) ගොවිතැන් කෙරුණේ බොහෝ දුරට පුළුල් ආකාරය කටය. 1950 පසු ක්‍රමයෙන් අඩුවන ඉඩම් කට්ටි ප්‍රමාණයන් තුළ ගොවිතැන් බොහෝ දුරට සූක්ෂ්ම හා ක්‍රමවත් පිළිවෙලකට කිරීමට අවශ්‍ය පහසුකම් රජයෙන් ලබා දීම මේ කාලයේ ඇති වූ විශේෂ ලක්ෂණයකි.

වැඩි අස්වනු ලබා දෙන එච්., අයි. ආර්., බී.ජී. ආදී දියුණු කළ වී වර්ග, රසායනික පොහොර, නව වගා ක්‍රම, ණය පහසුකම්, කෘෂි ව්‍යාප්ති සේවා වැඩි කිරීම් ආදී වශයෙන් අක්කරයකට අස්වැන්න ප්‍රමාණය වැඩි කර ගැනීමට අවශ්‍ය පහසුකම් රාශියක් ජනපද ගොවීන්ට ලබා දෙන ලදී.

මේ හැර, පෙර මෙන් නොව ජන පදයේ වාරි මාර්ග ක්‍රම සකස් කරන අවස්ථාවේදීම ජනපදිකයන්හට ඉඩම් ලබා දෙන ලදී. වාරි මාර්ග ඉදිකිරීම් වල රැකියා කරමින් හා ලැබුණු බිම් කොටස් සකස් කර ගොඩ බෝග වගා කරමින් සෑහෙන ආදායමක්, පදිංචි වී අවුරුදු දෙකක් තුළ ලබා ගත හැකි වේ යැයි නව ප්‍රතිපත්ති සැළසුම් කරන්නන්ගේ අදහස විය. පදිංචි වී අවුරුදු 2 ක් අවසන් වන විට වාරි මාර්ග පද්ධති සෑදීමේ වැඩ කටයුතු නිම වන ලෙස සැළසුම් කළ අතර, කෘෂි ජනපදිකයෙක් ලෙස අවුරුදු 2 ක කාලයක් ලද අත්දැකීමෙන් වාරිපෝෂිත කෘෂිකර්ම කටයුතු කිරීමට සුදුසු ආර්ථික ආයෝජන හා තාක්ෂණික වාතාවරණයක් සහ පුහුණුවක් ජන පදිකයන් තුළ ඇති වේ යැයි අපේක්ෂා කෙරිනි. විශේෂයෙන් ජන පදිකයින් වාරි මාර්ග ආදි ඉදි කිරීම් ආරම්භ කරන අවස්ථාවේදීම පදිංචි කර ලීමෙන් "ජනපදය හා තමන්ට ලැබූ ඉඩම තමන්ගේය" යන හැඟීම වැඩි කර ගත හැකි යයි ද සැළසුම් කරන්නන්ගේ අදහස විය. මෙම නව ප්‍රතිපත්ති හා අදහස් මාලාව "මුලින්ම ඉඩම් ලබා දීමේ සැලැස්ම" (Advance Alienation) යනුවෙන් හැඳින්වෙන අතර, 1953 සිට මේ දක්වා රජය මගින් ජනපද ඉඩම් දීමේ හා පදිංචි කිරීමේ ක්‍රියා මාර්ග මෙම සැළැස්ම මත පදනම් වී ඇත.

ජනපදකරණයේ නව ලක්ෂණ දෙකක් 1960 අග භාගයේ ඉදිරිපත් කරන ලදී.

(1) "විශේෂ ව්‍යාපෘති" යනුවෙන් හැඳින් වූ යෝජනා ක්‍රමයක් යටතේ මිනිපේ, ගල්ඔය, තබ්බෝව, පරාක්‍රම සමුද්‍රය, පදවිය ආදී පැරණි වාරි පෝෂිත ජනපද 09 ක් 1969 වන විට බෝග විවිධාංගීකරණීය පදනමක් මත සීඝ්‍ර දියුණුවකට භාජනය කරන ලදී. ඉතා කෙටි කලක දී එම ජනපද වී වගාවේ හා වෙනත් බෝග වගාවල විශාල වර්ධනයක් ලැබූ නිසා 1977 වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ වාරි පෝෂිත ජනපද 23 ක් පමණ දියුණු කර තිබුණි.

(2) 1960 අග භාගයේ දී තරුණ ගොවි ජනපද ක්‍රම ආරම්භ කරණ ලදී. 1965 – 1970 අවධිය වන විට ලක්දිව රැකියා වියුක්ත උගත් තරුණ පිරිස ලක්ෂ 6 ක තරම් ප්‍රමාණයක් විය. නිදහස ලත් අවධියේ සිට රටෙහි ක්‍රියාත්මක වූ ආර්ථික සැළසුම් දුර්වලතාවය එමගින් විදහා පෙනුනු අතර, මෙම ප්‍රශ්නයේ විභව දේශපාලනික ප්‍රතිඵල ඉතා බැරෑරුම් විය හැකි බව එවකට සිටි

දේශපාලන බලවතුන් හා විද්වතුන් හට වැටහී යැමත් සමගම ප්‍රශ්නයට විසඳුමක් ලෙස එවකට සිටි අග්‍රාමාත්‍ය ඩඩ්ලි සේනානායක මහතා විසින් තරුණ ගොවි ජනපද බිහි කිරීමේ ව්‍යාපාරයක් දියත් කරන ලදී. මෙහි පදිංචි කිරීමට තෝරා ගන්නා ලද්දේ ජ්‍යෙෂ්ඨ විභාගය සමත් කෘෂි පුහුණුවක් ලද අවිවාහක තරුණ තරුණියන්ය. රජය, මෙම පිරිසට වගා කිරීමට වාරි පෝෂිත ඉඩම් හා පදිංචියට ගොඩ ඉඩම් කට්ටි ලබා දුන් අතර යන්ත්‍ර සූත්‍ර පරිහරණයේ හා වෙනත් දියුණු ගොවි තැන් ක්‍රම පිළිබඳ තාක්ෂණික පුහුණුවක් ද ලබා දෙන ලදී. මෙම තරුණ ගොවි ජනපද ක්‍රමය ඉන් පසුව පත්වූ රජය යන් මගින් තව දුරට පුළුල් නොකලත් ආරම්භ කර තිබූ ජනපදවල තුළ බෝග විවිධාංගිකරණය හා සම්බන්ධ සේවා එලසින්ම ක්‍රියාත්මක කරන ලදී.

1970 – 77 රජය 30 අවුරුදු සැළැස්මක් මත සකසන ලද මහවැලි යෝජනා ක්‍රමය යටතේ මහවැලි එච් – කලාපය ආරම්භ කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ අක්කර 9,00, 000 (නව ලක්ෂයකට) කන්න දෙකක් වගා කිරීම සඳහා මහවැලි ජලය සැපයීම අපේක්ෂිත විය. මෙම අක්කර ප්‍රමාණයෙන් අක්කර 2,46,000 පැරණි ඉඩම් වශයෙන් ද, අක්කර 6,54,000 වාරි මාර්ග පහසුකම් ලබන අළුත් ඉඩම් වශයෙන් ද සැළකේ. ගොවි පවුල් 3,50,000 පමණ මහවැලි පද්ධතිවල පදිංචි කිරීම සහ දශ ලක්ෂයකට පමණ රැකියා ලබා දීමේ බලාපොරොත්තුවක්ද මෙම සැළැස්මේ මූලික අංග විය.

1977 දී බලයට පත් වර්තමාන රජය මගින් අනාගත වැඩිවෙන ජන ගහනයට රැකියා, ආහාර හා සමාජ සේවා ලබා දීමට යන සුවිශාල වියදම් ප්‍රමාණයේ බැරැරුම්කම් මත 30 අවුරුදු මහවැලි යෝජනා ක්‍රමය වෙනුවට කඩිනම් මහවැලි යෝජනා ක්‍රමයක් දියත් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ අවුරුදු 05 ක හෝ 06 ක කාලයක් ඇතුළත අක්කර 1,12,000 පමණ අළුත් ඉඩම් හා අක්කර 21,000 පමණ පැරණි ඉඩම් වලට මහවැලිය හරස් කර ඉදි කරණ ලද වික්ටෝරියා, මාදුරුඔය, රන්දෙණිගල, රන්ටැඹේ ආදී ජලාශ වලින් වාරි ජලය සපයා පවුල් 50,000 පමණ පදිංචි කර වීමට සැළසුම් කරන ලදී. 1988 වර්ෂය අ: සන් වන විට බෙද දෙන ලද අක්කර ප්‍රම:ණය 42.6% කින්ද, පදිංචි පවුල් ප්‍රමාණය 55.6% කින්ද වැඩි වී ඇත. මේ හැර වික්ටෝරියා, කොත්මලේ සහ රන්ටැඹේ යන බහු කාර්යය ව්‍යාපෘති මගින් එතෙක් සැපයුන විදුලිය හා සැස දීමේදී 100% ප්‍රමාණක් වැඩි පුර විදුලිය සැපයීමට හැකි විදුලි බලාගාර නිර්මාණය කරන ලදී.

බෝග විවිධාංගිකරණයක් හා කෘෂි ආශ්‍රිත හා කෘෂි කර්මයෙන් පිට අමු ද්‍රව්‍ය මත ගොඩනැගිය හැකි කර්මාන්තකරණයක් මහවැලි පද්ධතිවල ආරම්භ කෙරී ගෙන යයි. මේ හැර හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිරිඳිඔය ව්‍යාපාරය මගින් අදියර දෙකකින් අක්කර 21,500 ක් පමණ ප්‍රදේශයකට නව වාරි ජල පහසුකම් සපයා පවුල් 8800 ක් පදිංචි කර වීමට සැලසුම් කර ඇත. මේ බලාපොරොත්තු ඉටු කර ගැනීමට අවශ්‍ය කර්තව්‍යයන් සැළසුම් ක්‍රියාත්මක කිරීමේ දී ඇති වූ නෙ:යෙක් දුර්වලකම් හා වෙනත් බාධක මධ්‍යයේ දැනටමත් ක්‍රියාත්මක වෙයි. 1980 දශකයේ රජයේ ආයෝජන ලද ජනපද ව්‍යාපාරවල නව නැම්යාවන් රාශියක් ද දක්නට ඇත.

1. පැරණි ව්‍යාපාරවල වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කර ජල පහසුව වැඩි කිරිම හා එම ව්‍යාපාර යටතේ වගා කෙරෙන භූමි ප්‍රමාණය වැඩිකිරිම.

2. බෝග විවිධාංගිකරණය කිරීමට අදළ පහසුකම් වැඩි කිරීම.

3. කෘෂිකර්මයෙන් බාහිර රැකියා මාර්ග ඇති කිරීම සඳහා සැළසුම් කිරීම.

4. ජනපද ව්‍යාපාර, ඒකාබද්ධ වූ ප්‍රාදේශීය සංවර්ධන පද්ධති ලෙස සළකා, ප්‍රාදේශීය සංවර්ධන සැළැස්මක් ඇති කිරීමට ප්‍රයත්න දැරිම.

5. අනවසරයෙන් පදිංචි ඉඩම් හා පදිංචිකරුවන් ජනපදයක අන්තර්ගත කොටස් සේ සළකා සීමා සහිත පහසුකම් සැපයීමට සැළසුම් කිරිම හා

6. අනූනව වසර බදු ඔප්පුව වෙනුවට ''ස්වර්ණ භූමි'' ඔප්පු වශයෙන් හඳුන් වන සීමිත සින්නක්කර ඔප්පු විශේෂයක් ජන පදිකයන්ට ලබා දීම, මින් සමහරකි.

ජනපද හා සම්බන්ධ පරිපාලන වාර්තා අනුව 1920 සිට 1950 දක්වා ජනපද ආරම්භ කිරිම සඳහා රජය මගින් රුපියල් මිලියන 27.7 ක් වැය කර ඇත. 1970 වන විට එම වියදම රුපියල් මිලියන 2,000 ක් (රුපියල් බිලියන 2 ක්) ඉක්මවා ගොස් ඇති බව වාර්තා වේ. මහවැලි යෝජනා ක්‍රමය යටතේ අද දක්වා (1988) රුපියල් බිලියන 50,000 (රු. 50, 000,000,000) ඉක්මවා ආයෝජනයක් කර ඇති බව සටහන් වී ඇත. සමස්ථයක්

වගුව අංක 1

**රජයේ ඉඩම් බෙදදීම 1930–1988**

| ජනපද වර්ගය | බෙදදුන් අක්කර ප්‍රමාණය | සම්පූර්ණ ඉඩම්ලාභී පවුල් සංඛ්‍යාව |
|---|---|---|
| වාරි ජනපද | 5,31,123 | 1,44,583 |
| උස්බිම් ජනපද | 33,242 | 9,781 |
| යොවුන් ජනපද | 19,673 | 7,232 |
| ගම් පුළුල් කිරීමේ ව්‍යාපාර | 8,83,258 | 6,16,658 |
| මධ්‍යම පන්ති ව්‍යාපෘති | 1,28,595 | 10,158 |
| ආන්තික ඉඩම් ව්‍යාපෘති | 19,396 | 604 |
| විශේෂ බදු ඉඩම් ව්‍යාපාර | 13,221 | 106 |
| එකතුව | 16,25,864 | 7,89,422 |
| මහවැලි : 1988) * | 1,89,641 | 77,809 |
| (කිරිඳිඔය : 1988) * | 10,035 | 4,096 |

* (මහවැලි හා කිරිඳිඔය ජනපද සංඛ්‍යා ලේඛණ අනුව)

මූලාශ්‍රය : ඒ. ඒ. විජේතුංග, 'ඉඩම් සංවර්ධන ආඥා පනත් ප්‍රතිඵල', ඉඩම් සංවර්ධන ආඥා පනත: 1935 පිළිබඳ සම්මන්ත්‍රණය, 1985, කොළඹ, 5. පිටුව.

ලෙස ගතහොත් 1930 සිට අද දක්වා ලක්දිව ඇති 107 ක් පමණ වූ ප්‍රධාන ජනපද යෝජනා ක්‍රම වලට යෙදූ සම්පූර්ණ රජයේ ආයෝජනය රුපියල් බිලියන 65,000 ඉක්මවා ඇති බවට දළ ඇස්තමේන්තුවක් කළ හැක. මෙම ඇස්තමේන්තුව පිළිගතහොත් එමගින් කියවෙන්නේ 1930 සිට 1988 දක්වා මහවැලි ඇතුළු 107 ක් පමණ ප්‍රධාන ජනපද යෝජනා ක්‍රමවල පවුල් 2,33,175 පමණ සංඛ්‍යාවක් පදිංචි කරලීමට හා අක්කර ලක්ෂ 08 කට ආසන්න භූමි ප්‍රමාණයක් සංවර්ධනය කිරීමට රු. 65,000,000,000 ඉක්මවා වියදමක් දැරීමට සිදුව ඇති බවය.

මෙලෙස ප්‍රමුඛ සංවර්ධන කාර්යයක් ලෙස සලකා විශාල වියදමක් දරා ඉදිකරන ලද ජනපද තුළින් රටේ ගැටළු, ආර්ථිකයට සිදු වූ සේවය, ජනපද ආශ්‍රිත වර්තමාන හා අනාගත ප්‍රවනතා පිළිබඳව සළකා බැලීම කාලෝචිතය.

## 2. ජනපදවලින් සිදු වූ සේවය

ජනපද ක්‍රමය ආරම්භ වීම නිසා ලංකාවේ සීමිත සම්පත් ප්‍රමාණය මත රොක්වන ජනගහන වර්ධනය වීම් නිසා ඇති විය හැකි විශාල සමාජ අරගලයක් ප්‍රමාද කිරීමට හැකි විනැයි නිගමනය කළ හැකිය. ආරම්භයේ සිට අද දක්වා තෙත් කලාප යෙන් ජනපදවලට ඇදී ගිය ජන ගහනය තෙත් කලාපයේ ම රැඳී සිටියේ නම් සහ එම කලාපය තුළත් ගම් පුළුල් කිරීම් වැනි ජනාවාස කරණය ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොවීනම්, එම කලාපයේ අද පවතින ජනගහන ආශ්‍රිත ප්‍රශ්න, (ඉඩම් නැතිකම, රැකියා විරහිත භාවය හා දිළිඳුකම) මීට වඩා උග්‍ර වනු නොඅනුමානය.

අනෙක් අතින් වියළි කලාපීය ජනපද ඇති කිරීම රටේ පවත්නා සමාජ ආර්ථික ප්‍රශ්න විසඳීමට ගත් ව්‍යාකුල නොවූ මහක් ලෙස සැළකිය හැකිය. උදහරණ වශයෙන් තෙත් කලාපයේ ප්‍රශ්ණ විසඳීමට එම කලාපයේ පුද්ගලික ඉඩම් විශාල වශයෙන් රජයට පවරා ගෙන නැවත මහජනයා අතර බෙදන්නට තැත් කළේ නම් මෙයට වඩා දැඩි ව්‍යුහික වෙනස්කම් හා ප්‍රශ්න තෙත් කලාපය තුළ ඇති වනු ඇත. 1970 – 77 කාලයේ ඉඩම් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය නිසා ඇති වූ කෙටි හා දීර්ඝ කාලීන නිෂ්පාදන ප්‍රශ්න, ඉඩම් ලාභීන් තුළ ගොඩනැගුණු භුක්ති අස්ථායිතා, රජයට ගත් සශ්‍රීක ඉඩම් පාලනය තුළින් ඇති වූ දුර්වලතා ආදිය අනුව, ව්‍යුහික වෙනස්කම් සිදු කරන ප්‍රතිපත්ති වල ඇති බැරෑරුම්කම් මොනවට වැටහෙනු ඇත. මේ අනුව ජනපද ඇති කිරීම දීර්ඝ කාලීන ආර්ථික – සමාජ පරිවර්තනයක් කළ හැකි අර්බුද කාරී නොවන මහක් ලෙස සමහර සමාජ විද්‍යාඥයන් විසින් හඳුන්වා දී ඇත.

ඉඩම් කොමසාරිස් වරයාගේ වාර්තාවක් අනුව 1985 වන විට රජයේ ඉඩම් ජනපද අනුව බෙදා දී ඇති ආකාරය ද, ඉඩම් ලාභී පවුල් සංඛ්‍යාව ද අංක 1 දරණ වගුවෙහි දක්වේ.

මෙම සංඛ්‍යාව අනුව ලංකාවේ සම්පූර්ණ භූමි ප්‍රමාණය වූ අක්කර දශ ලක්ෂ 16 න් 10% පමණ ජනපද ක්‍රම අනුව රජය මගින් මහජනයා වෙත බෙදා දී ඇත. ඉඩම් කොමසාරිස් ගේ වාර්තාවේ දක්වෙන පරිදි 1984 දක්වා ඉඩම් ලාභී පවුල් සංඛ්‍යාව වූ 7,89,482 ට මහවැලි හා කිරිඳි ඔය ව්‍යාපාර යටතේ පදිංචි කළ සංඛ්‍යාව එකතු කළ විට 1986 දක්වා නොයෙක් ජනපද යෝජනා ක්‍රම යටතේ පදිංචි කර ඇති මුළු පවුල් සංඛ්‍යාව 8,45,502 පමණ වේ.

ජන සංගණන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තු අනුව ග්‍රාමීය පවුලක, සාමාන්‍ය සාමාජික සංඛ්‍යාව 5.2 පමණ වේ. මෙම සංඛ්‍යාව සාමාන්‍ය පවුලක ජනපද සාමාජික සංඛ්‍යාව හා සමාන වේ යැයි උපකල්පනය කළ හොත් ජනපද යෝජනා ක්‍රම මගින් 43,96,610ට නොඅඩු ජන සංඛ්‍යාවකට (ලංකා ජන ගහනයෙන් 26.8%) ජීවනෝපාය හා වාස ස්ථාන ලබා දී ඇති බව සැලකිය හැකිය.

මෑතකදී ඉදිරිපත් කරන ලද පර්යේෂණ ලිපියක් (වනිගරත්න : 1988) අනුව, ජනපද ජනගහනයට ජනපද රක්ෂිත ඉඩම් අල්ලා ගත් පුද්ගලයින් (පවුල්) එක්කල විට ජනපද ආර්ථිකයෙන් පෝෂණය වන සම්පූර්ණ ජනගහනය 45,86, 002 (ලංකා ජන ගහනයෙන් 31.6%) නොඅඩු වේ යැයි දළ වශයෙන් සැළකිය හැකිය. රජයේ ඉඩම් වලින් 90.6%ක්ම බෙදා දී ඇත්තේ රටේ ඉතාමත් දුප්පත් කොටස් වලට බව ද වගු අංක 1 න් අනාවරණය වේ.


මෙම ඇස්තමේන්තුවට මධ්‍යම පන්තික ව්‍යාපෘති, ආන්තික ඉඩම් ව්‍යාපෘති හා විශේෂ බදු ඉඩම් ව්‍යාපෘති අනුව ඉඩම් ලැබූ අය අඩංගු නොවේ. ආහාර නිෂ්පාදනය (විශේෂයෙන් වී නිෂ්පාදනය) අතින් බලන කල ලංකාවේ සම්පූර්ණ වී නිෂ්පාදනයෙන් 40 – 45% ප්‍රමාණයක් වාරි පෝෂිත ජනපද 107 ක් තුළින් නිපදවෙන බැව්, වී නිෂ්පාදන සංඛ්‍යා ලේඛණ අනුව පෙනී යයි. එම ජනපද වල වී නිෂ්පාදනයේ සාමාන්‍ය වේගය 1974 – 77 කාලය තුළ 4.1% ක් වූ අතර 1977 –82 කාලය තුළ එය 8.8% දක්වා වැඩි විය. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ වාර්තාවක් අනුව මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වී ඇත්තේ වාරි පෝෂිත අක්කර ප්‍රමාණය වැඩි වීමයි. උදහරණ වශයෙන් 1977 පමණ සිට වසරකට අක්කර 22,000 ක් බැගින් දළ වාරි පෝෂිත බිම් ප්‍රමාණයක් වියලි කලාපීය ජනපද මගින් රටේ ආර්ථිකයට එක් වේ. 1974 –82 කාලය තුළ ඇති වූ වී නිෂ්පාදනයේ වාර්ෂික වැඩි වීමෙන් 65% ක් ජනපද වලින් ඇති වූ බව එම අමාත්‍යාංශ වාර්තාව තවදුරටත් දක්වයි.

වියලි කලාපීය වාරි පෝෂිත ජනපද තුළ පදිංචි සාමාන්‍ය පවුල් ලබන මාසික ආදයම ජනපද නොවන ග්‍රාමීය පරිසරයේ පවුලකට ලැබෙන ආදයමට වඩා තුන්හතර ගුණයක් පමණ වේ යයි ද වාර්තා වේ. උදහරණ වශයෙන් ජනපද කුටුම්බයක ලබන සාමාන්‍ය දළ මාසික ආදයම රු. 2000 ක් පමණ වන අතර වියලි කලාපයේ ජනපද වලට අයත් නොවූ ගම්බද පෙදෙස් වල කුටුම්බයන්හි දළ මාසික ආදයම රු. 550/— ක් පමණ වේ.

ජනපද ආරම්භ කිරීම නිසා ඊට පෙර නොදියුණු තත්ත්වයක පැවැති ප්‍රදේශ කෘෂිකර්මය, සේවා පහසුකම් හා ප්‍රාග්ධනය ගොඩ නැගීම් අතින් පෙරට වඩා සංවර්ධනයක් ලබා ඇති බව කවුරුත් පාහේ පිළිගත් කරුණකි.

## 3. ජනපද ආශ්‍රිත ගැටළු

ජනපද සංවර්ධනය පිළිබඳ මෑතකදී පළ වී ඇති ග්‍රන්ථ, ලිපි හා සම්මන්ත්‍රණ වල ඉදිරිපත් කර ඇති කරුණු හා ක්ෂේත්‍ර පර්යේෂකයන් සහ ජනපද සැළසුම් කරන්නන්ගේ අත් දැකීම් අනුව ජනපද තුළ




## උස්බිම් ජනාවාස

01. කිරාන්චි
02. මුලන්ගාවිල්
03. පුතුවෙඩ්ඩුවාන්
04. කනගපුරම්
05. තාරම්පුරම්
06. විස්වමඩුකුලම්
07. දිව්පුරම්
08. සූත්තින්පුරම්
09. අන්අන්තිපුරම්
10. කුඹුරුපිටිය
11. පලකාඩු
12. වනාතවිල්ලු
13. සිල්ලන්කන්ඩල්
14. අත්තුවිල්ලු
15. කිවුල
16. සිරුකිව්ල
17. විල්පොත
18. පල්ලෙකැලේ
19. කඩිගම
20. වඩුරුස්ස
21. හල්මිල්ල
22. කොස්වාන
23. මාගන්දන ඔය
24. නාමල් ඔය
25. මුතුකන්ඩිය
26. නක්කල
27. හුලන්දාව
28. කටුගහගල්ගේ
39. වීරයාය
30. හඳපාන්ගල
31. ඉඹුල්පේ
32. එරත්න
33. කරවිට
34. දෙල්ගොඩ
35. මාදෙල්ගම
36. හැඩිගල්ල
37. කිනියාවල
38. නාපේ යෝජනා ක්‍රම
39. බඹරවාන ජනාවාසය
41. බටුවන්ගල ජනාවාසය
42. හිණිදුම
43. හල්විටිගල
44. දම්මාල
45. දන්ගල
46. දේවාලේ ගම
47. කළුබෝවිටියාන
48. දීරන්ගල
49. රොටඹ
50. රම්මල කන්ද
51. කොට්ටාව ජනාවාසය
52. උඩවැලිවිටිය

## මහා පරිමාණ ජනාවාස

01. වන්නියාර් කුලම්
02. අක්කරියාන්කුලම්
03. කොඩ්ඩිකඩ්ඩිනාකුලම්
04. මරුතාන්කුලම් i
05. මරුතාන්කුලම් ii
06. කන්නියාන්කුලම්
07. තම්බලපෙරුමාල්කුලම්
08. පණ්ඩිවිරිච්චාම්
09. පෙරියමඩු
10. මුල්ලිකුලම්
11. වාහල්කඩ
12. මොරවැව
13. ගල්විටිවැව
14. කන්තලේ
15. හුරුළුවැව
16. නාච්චදූව
17. කාගම කට්ටියාව
18. වෙවැල් වැව
19. කන්ඩලම
20. කවුඩුල්ල වැව
21. කිඹුල්වාන ඔය
22. හක්වටුනා ඔය
23. දේවහුව
24. සියඹලන්ගමුව
25. පහරිය
26. තඹබ්බෝව
27. කොට්ටුකච්චිය
28. උරියාව
29. මහ උස් වැව
30. මහකුරුක්කන්වල
31. මුදලන්කුළු වැව
32. විජයකටුපොත
33. රිදීබැඳි ඇල්ල
34. හත්තොට ඇනිය
35. පිඹුරත්තැව
36. මන්දුලන් ඔය
37. මුතුකන්ඩිය
38. ඔක්කම්පිටිය
39. යුදගනාව
40. දෙබර වැව
41. බලපාරුව
42. මහගෙවැව
43. බඳගිරිය
44. මුරුත්තෙවල
45. හම්බෙගමුව
46. කල්තොට

තරුණ ජනාවාස නාමාවලිය මෙහි ඇතුළත් නොවේ.

මතු පිටින් පෙනෙන්නට තිබෙන සමෘද්ධිය යටින් ඉඩම් හා කෘෂිකර්ම පදනම දුර්වල වෙමින් පවතින බවට අනතුරු හැඟවීමක් කෙරේ. ජනපද මග දෙපස ඇති සමෘද්ධිය ජනපද ඇතුලත බොහෝ විට දක්නට නැත. මේ ප්‍රකාශන හා අත්දැකීම් අනුව ජනපද නොවන ගම් ප්‍රදේශ වල පවතින දුප්පත්කම ජනනය කරන හේතූන් ජනපද තුළත් ඇති වෙමින් පවතින බව පෙනේ. ජනපද සංවර්ධන පදනම මෙලෙස දුර්වල වීමට හේතු රාශියක් දැනට හඳුනා ගෙන ඇත. ඒවායින් ප්‍රධාන කරුණු කීපයක් නම්,

**(අ) වී ගොවිතැනේම එල්බගෙන සිටීම**

වාරි ජනපද සකස් කර ඇත්තේ වී ගොවිතැනට ජනපද ආර්ථිකයේ මුල් තැනක් දෙමිනි. ජනපද ආරම්භක කාලයේ (1930 දශකයේ) සැළසුම් බොහෝ සේ රැඳී තිබුනේ කෘෂි කර්මය මගින් ජනපදිකයන්ට අවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයීම හා රට තුළ ආහාර නිෂ්පාදනයට රුකුලක් දීමේ පරමාර්ථ මතය. මේ අනුව ජනපද තුළ වාරි මාර්ග පද්ධතිය වාරි ජල පාලකයන්ගේ කාර්ය භාරය හා කාල සටහන්, ජලය නිකුත් කරන වේලාවන්, ශ්‍රම හා ආයෝජන ප්‍රාග් ධන යෙදුම් කාලයන්, වෙළඳ කාර්යයන්, ජන පදිකයන්ගේ වැඩ කරන හා නිදහස් කාල වේලාවල් ආදී ජනපද ආශ්‍රිත බොහෝ ආර්ථික හා සාමාජීය වැඩ කටයුතු වී ගොවිතැනේ කාර්ය කාල සටහනට ගැලපෙන සේ සකස් වී ඇත. මේ නිසා පුළුල් ආර්ථික විවිධාංගීකරණයන් කොතරම් වැදගත්/ලාභදායි වුවත් ඒ සමගම ඇති විය යුතු ජනපද සමාජ – ආර්ථික පද්ධතියේ කාල සටහන් හා කාර්ය වෙනස්කම් සිදුකිරීම ද සම්ප්‍රදායික වී ගොවිතැනින් භෝග විවිධාංගිකරණයකට යෑමද ඉතා අසීරු කරුණක් වී ඇත.

**(ආ) පලදා වර්ධන ගැටළුව**

1952 හා 1982 අතර කාලය තුළ ජනපද වී නිෂ්පාදනයෙන් 51%ක්ම අක්කරයකට ලැබූ අස්වැන්න ප්‍රමාණයේ වර්ධනය මත රැඳී පැවතිණ. ජනපද තුළ බිම් ඒකකයකින් ලැබෙන අස්වැන්න ප්‍රමාණය පුරාණ ගම් ආශ්‍රිත කුඩා වාරි මාර්ග පෝෂිත බිම් හා වර්ෂා පෝෂිත බිම් වලට වඩා වැඩි වුවත්, ලක්දිව වී ගොවිතැනෙහි පසු ගිය දශකය තුළ පෙනුනු ඒකක අස්වැන්න ප්‍රමාණය වැඩි වීමේ සීඝ්‍රතාවය හීන වීම ජනපද තුළත් දක්නට ඇත. උදාහරණයක් වශයෙන් ලක්දිව වී ගොවිතැනෙහි ඒකක අස්වනු ප්‍රමාණය වැඩි වීම 1950 දශකයේ අග භාගයේ සිට 1970 දශකයේ මුල් භාගය දක්වා වර්ෂයකට 4.6% සීඝ්‍රතාවයකින් සිදු වූ අතර 1980 සහ 1985 කාලය තුළ එය 3.3% දක්වා පහත වැටිණි. (සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය : ආයෝජන සැළැස්ම 1986 වගු අංක 3.1, පිටු 52). ජනපද තුළත් එවැනිම ඒකක ඵලද වර්ධනයේ හීනවීම් දක්නට ඇති බැව් මැතකදී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ඉදිරි පත් කරන ලද වාර්තා හා ලිපි මගින් පෙන්නුම් කරයි. අක්කරයකට වී බුසල් 65—70 දක්වා සාමාන්‍ය පලදා මට්ටමක් ලක්දිව වී ගොවිතැනේ පවතී.

බිම් ඒකකයකින් ලැබෙන වී අස්වැන්න ප්‍රමාණයේ විශාල දියුණුවක් පසු ගිය දශකය තුළ නො තිබීමට හේතු පැහැදිළි නැත. එයට ස්ථානීය දේශගුණික බලපෑම් ද තිබිය හැකිය. ජනපද ඉඩම් වල ඒකක අස්වැන්න ප්‍රමාණය ක්ෂේත්‍රයේ වැඩි කර ගැනීමට අවශ්‍ය මූලික පර්යේෂණ කටයුතු දියුණු කිරීම උදෙසා දැනට වඩා රජය මගින් කෘෂි පර්යේෂණ අංශ වලට ආයෝජනයන් කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇත.

මහවැලි හා කිරිඳි ඔය ව්‍යාපාර 1980 – 1985 කාලය තුළ සංවර්ධනය වෙමින් පැවතුනත් එම කාලය තුළම ලංකාවේ වගා බිම් ප්‍රමාණයේ වැඩි වීමේ වේගය 1.4% පමණ පහත මට්ටමක පැවතිණ. ජල පහසුකම් නැතිවීම, පසේ සශ්‍රිකතාවය හීනවීම ආදිය නිසා පෙර වගා කල බිම් දැනට පුරන් තත්ත්වයට වැටීම ගොඩනැගිලි මාර්ග ජලාශ හා නව වාරි මාර්ග ඉදිකිරීම් නිසා පෙර වගා කල බිම් කොටස් නැතිවී යෑම, ආන්තික බිම් වගා යටතට ගැනීමට යන අධික වියදම් නිසා එම පරිශ්‍රමයන් අඩාල වීම, ආදී හේතූන් ඉහත කී වගා බිම් වැඩි වීමේ වේගය හීන වීමට තුඩු දුන් කරුණු ලෙස සැලකිය හැකිය.

එහෙත් 1980 – 1985 කාලය තුළ දී නව වැඩි ඵලදායී වී වර්ග වගා කරන භූමි ප්‍රමාණය වැඩි වීමේ වේගය වසරකට 3% ක් පමණ විය. මෙම වේගය එම කාලය තුළදී වූ ඒකක අස්වැන්න ප්‍රමාණයේ වර්ධන වේගයට (3.3%) ආසන්න විය. මේ අනුව 1980 දශකය තුළ දී වී නිෂ්පාදන ප්‍රමාණයේ වර්ධන වේගය බොහෝ දුරට දියුණු වී වර්ග භාවිත කරන අක්කර ප්‍රමාණය වැඩිවීම නිසා ඇති වූවක් මිස, බිම් ඒකකයකට ලැබෙන අස්වැන්න ප්‍රමාණයේ වැඩි වීම නිසා වූ ප්‍රතිඵලයක් ලෙසට සැලකිය නොහැකිය. මෙම නිගමනය ජනපද ආශ්‍රිත වී නිෂ්පාදනයේ වර්තමාන තත්වය පැහැදිළි කිරීමටත් අදළ වේ.

**(ඇ) නිෂ්පාදන වියදම් වැඩිවීම**

පසු ගිය දශකය තුළ ඒකක අස්වැන්නේ වර්ධන වේගය හීන වී ඇති අතර නිෂ්පාදන වියදම් සීඝ්‍ර වර්ධනයකට පත් ව ඇති බව පෙනී යයි.

නිදසුනක් ලෙස කිරිඳිඔය ජනපද ප්‍රදේශයේ හෙක්ටයාරයක වී නිෂ්පාදනය 1976/77 සිට 1985/86 කාලය අතර 5% ක වේගයකින් වැඩි වූ අතර නිෂ්පාදන වියදම එම කාලය තුළම වසරකට 9% ක වේගයකින් වැඩි වී ඇත. වී ගොවිතැනින් ලැබෙන ශුද්ධ ලාභය පහත වැටෙමින් පවතී. මහවැලි එච්. කලාපයේ මහ 1980/81 සිට මහ 1984/85 කාලය, ඇතුළත වී නිෂ්පාදන වියදම 23% කින් වැඩි වී ඇත. ශුද්ධ ආදයම වැඩි වී ඇත්තේ 12% කින් පමණි. නිෂ්පාදන වියදම වැඩි වීමත්, ඒකක නිෂ්පාදනය හා එහි මිල එලෙස වැඩි නොවීමත් නිසා වී ගොවිතැනින් ලැබෙන ආදයම ක්‍රමයෙන් අඩු වී යන බව මින් පැහැදිලි වේ. නිෂ්පාදන මිල ක්‍රමයෙන් ඉහළට යන අතර පොහොර ආදී මිල අධික යෙදුම් භාවිතය නිර්දේශ කරන ප්‍රමාණයට වඩා අඩුවෙන් යෙදීමත් ගොවි තැනෙහි සිදු වෙමින් පවතී. නැවත මෙය අස්වැන්න හීන වීමට බලපායි. චක්‍රිය ලෙස බලපාන මෙම නිෂ්පාදන වියදම් වැඩි වීමේ ලක්ෂණ නිසා වී වගාවෙන් ප්‍රධාන ලෙස ජීවනෝපාය රැක ගන්නා ජනපද ගොවීන්ගේ ජීවන තත්ත්වය ක්‍රමයෙන් දුර්වල වීමක් මෙමගින් පිළිබිඹු කෙරේ.

**(ඈ) ශ්‍රම භාවිතය පිරිහීම**

මහවැලියත් කිරිඳිඔයත් ඇතුළුව ලක්දිව සියළු වාරි පෝෂිත ජනපදවල බහුල ලෙස පවතින සම්පත ලෙස මිනිස් ශ්‍රමය සැළකිය හැකිය. එහෙත් ක්‍රමානුකූල වගා කිරීම් උදෙසා කෙරෙන ජල පාලනයන් හා එය අනුව සකස් වෙන

වී ගොවිතැනේ කාර්යය කාලයන් අනුව කෙටි කාලීන ශ්‍රම හිඟයක් වගා කාලයන්හි දක්නට ලැබේ. මෙම අවස්ථා වලදී ජනපද අවට ගම් හා ප්‍රදේශයන් වලින්ද, ජනපද තුළින් ද, කුලී ශ්‍රමය වගා කාර්යයන් සම්පූර්ණ කිරීමට ලබා ගැනීමක් පවතින නමුදු වගා කටයුතු අඩු කාලයේ රැකියා හිඟ පවතී.

දැනට ජනපද වී ගොවිතැනේ සම්පූර්ණ වියදමෙන් 43% ක් පමණ කුලී ශ්‍රමය සඳහා වැය කිරීමට ගොවීන්ට සිදු වී ඇත. මෙය කෙටි කාලීන ශ්‍රම ඉල්ලුම් හා බැඳීමෙන් දුර්වල ගොවි ආර්ථිකයට මුහුණපෑමට වී ඇති ප්‍රබල ප්‍රශ්නයක් වන නිෂ්පාදන වියදම වැඩි වීමට ප්‍රධාන හේතුවක් ද වන අතර නිෂ්පාදිතයා මුහුණ දිය යුතු බරපතල ප්‍රශ්නයක් ද වේ.

වගා කාර්ය ඉක්මනට කර ගැනීමට කලක් තිස්සේ රෝද 4 සහ රෝද 2 ට්‍රැක්ටර් භාවිතය ජනපද වී ගොවිතැනෙහි වැඩි වී ඇති අතර, පෙර යන්ත්‍ර පාවිච්චි නොකළ කාර්යයන් සඳහා (උදා: පැල සිටුවීම, කොළ මැඩීම, නව යන්ත්‍ර පාවිච්චි කිරීමක් මෑතක සිට ආරම්භ වී ඇත. ක්‍රමයෙන් යන්ත්‍ර පාවිච්චියට ඇබ්බැහි වී ගෙන යන ජනපද කෘෂිකර්ම රටාව නිසා නිෂ්පාදන වියදම් අඩු කර ගැනීමට හැකි වීමෙන් ගොවීන්ට යම් සෙතක් සැලසී ඇත. එහෙත් අවශ්‍ය පොහොර හා කෘෂි රසායනික ද්‍රව්‍යයන්හි මිල දිනෙන් දින වැඩි වීම නිසා නව යන්ත්‍ර පැවිච්චියෙන් ලබන වියදම් අඩුවීම සමස්ථයක් වශයෙන් ජනපද ගොවි ආර්ථිකය දියුණු කිරීමට සැලකිය යුතු රුකුලක් වී නැත. මේ අතරම නව යන්ත්‍ර භාවිතය නිසා කුලී ශ්‍රම භාවිතයට තර්ජනයක් ද එල්ල වී ඇත.

කුලී වැඩ කිරීමෙන් ජීවනෝපාය රැකගත් ජනපද හා අවට පෙදෙස් ආශ්‍රිත ඉතා දුප්පත් ජන කොටස් වලට මේ නිසා වෙනත් ආදයම් මාර්ග සොයා ගැනීමට සිදුව ඇත.

ජනපද ආරම්භයේ සිට පැවතුන ශ්‍රම ඉල්ලුම උපරිම අවස්ථා වලදී තෙත් කලාප ප්‍රදේශ වලින් කුලී ශ්‍රමිකයන්

**1980 - 1985 කාලය තුළ දී නව වැඩි එලදායී වී වර්ග වගා කරන භූමි ප්‍රමාණය වැඩි වීමේ වේගය වසරකට 3% පමණ විය. මෙම වේගය එම කාලය තුළදී වූ ඒකක අස්වැන්න ප්‍රමාණයේ වර්ධන වේගයට 3.3% ට ආසන්න විය. මේ අනුව 1980 දශකය තුළ දී වී නිෂ්පාදනයේ වර්ධන වේගය බොහෝ දුරට දියුණු වී වර්ග භාවිතා කරන අක්කර ප්‍රමාණය වැඩිවීම නිසා ඇති වූවක් මිස, බිම් ඒකකයට ලැබෙන අස්වැන්න වැඩිවීම නිසා වූ ප්‍රතිඵලයක් ලෙසට සැලකිය නොහැකිය. මෙම නිගමනය ජනපද ආශ්‍රිත නිෂ්පාදනයේ වර්තමාන තත්වය පැහැදිලි කිරීමටත් අදාළ වේ.**

ජනපද වලට සංක්‍රමණය වීමේ ස්වභාවය නොයෙක් හේතූන් නිසා දැන් හීනව ගොස් ඇත. මෙම ශ්‍රම පුරප්පාඩුව වියලි කලාපීය ජනපද තුළින්ම සංක්‍රමනය කරන කුලී ශ්‍රමිකයන් ගෙන් වැයි යැමක් අද දක්නට ලැබේ. නව යන්ත්‍ර පැවිච්චිය වැඩි වත්ම මෙම ශ්‍රමිකයන් අතර තරඟය තියුණු වන හෙයින් වර්තමානයේ ජනපද තුළ දක්නට ලැබෙන ඒකාකාරී ශ්‍රමික වේතන තත්වයට එය බලපානු ඇත. දැනටත් මහවැලි 'එච්' කලාපය, රාජාංගනය, කිරිඳි ඔය ආදී ජනපද වල කුලී ශ්‍රමිකයන් අතර තරඟය නිසා කුලී වේතන නොවෙනස් තත්ත්වයක රඳා පවතින බව මෑතකදී කළ ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් හෙළිවේ.

ජනපද තුළ පවතින තත්ත්වය හා ආශ්‍රිත තත්ත්වයන් ජනපද තදාසන්න ගම් හා ප්‍රදේශ තුළ ද පවතී. ගම් තුළින් වර්තමානයේ බිහිව ඇත්තේ ක්‍රමයෙන් ප්‍රසාරණය වන නිත්‍ය හෝ කාලීන රැකියා විරහිත ශ්‍රමික ජනගහණයෙකි. මෙම තත්ත්වය ජනපද තුළ ක්‍රමයෙන් වැඩිවේ. ඒ සමඟම පැන නැඟී ඇති ස්ථතික තත්වයේ පවතින ශ්‍රමික වේතන මත රටේ පවතින ආර්ථික උද්දමනයේ බලපෑම් ගොඩ ගැසීම නිසා ජනපද ආර්ථිකය සම්බන්ධ කුලී ශ්‍රමිකයන් ගේ ජීවන තත්ත්වය ද පහත වැටෙමින් පවත්නා බැව් නිගමනය කළ හැක.

### (ඉ) ජනපද ඉඩම් හා එහි ආදයම් අහිමිවීම

ජනපදවල වැඩිවෙන ජනගහනය ක්‍රමයෙන් ජනපද ඉඩම් හා එහි ආදයම් භුක්තියෙන් ඈත් වී යන ලකුණු පහළ වී ඇත. මෙයට බලපාන සාධක රාශියකි.

(1) ජනපද ඉඩම් භුක්තිය සීමිත කරන ඉඩම් සංවර්ධන පනත්වල බලපෑම:— මෙම නීති වලට අනුව බෙදා දෙන ලද ඉඩම් වල පසු අයිතිය උපරිම වශයෙන් පුද්ගලයෙකුගේ උරුමක්කාරයන් දෙදෙනෙකුට පමණක් සීමා වේ. සාමාන්‍ය වශයෙන් උරුමය ලැබෙනුයේ එක් අයකුට පමණි. මේ අනුව එක් ඉඩම් කට්ටියකට 99 වර්ෂ බදු ඔප්පුව හෝ ස්වර්ණ භූමි ඔප්පුව හෝ ලැබිය හැක්කේ එම ඉඩමේ ඇති ගොවි පවුලේ සාමාජිකයින් ගෙන් එක් අයෙකුට හෝ දෙදෙනෙකුට පමණි.

(2) ගොවි පවුල් වල වැඩි වන ජනගහනය සිය ගොවිපලට උපයෝගී කර ගෙන පෝෂණය, ආදයම් හා රැකියා අවශ්‍යතා ලබාදීමට සහ තම පවුලේ වර්තමාන ජීවන තත්ත්වය ඒ ආකාරයෙන් වත් දිගටම පවත්වා ගෙන යෑමට නොහැකි තත්ත්වයක් අද දක්නට ලැබේ. එම නිසා ඉඩම් නීති වලට අනුකූල නොවූවත් බොහෝ විට සමාජ සිරිත් ප්‍රකාර පවුල් ජනගහනය පවුලේ

ඉතා සීමිත සම්පත් (ඉඩම්) වලින් පෝෂණය කිරීමට සිදුවන හෙයින් ජනපද පවුල්වල පොදු ජීවන තත්ත්වය ක්‍රම ක්‍රමයෙන් හීන වී ගෙන යයි. මෙය වලක්වා ලීමට භෝග විවිධාංගිකරණය, හා කෘෂිකර්මයෙන් පිට රැකියා මාර්ග පිළිබඳ රජයේ ජනපද සැළසුම් අංශවල නිතර සාකච්ඡා කෙරෙන නමුදු, යථාර්ථය වන්නේ එවැනි ආර්ථික විවිධාංගිකරණයක් ස්ථිර ලෙස ජනපද ආර්ථිකයේ තවමත් බිහිවී නැති බවය.

වැඩිවන ජනගහනය ජනපද ඉඩම් හා වී ගොවිතැන මත රැඳී පවතී. එහෙත් ඉඩම් නීති බලපෑම අනුව විශාල ලෙස ඉඩම් කැබලිවීමක් හෝ විශම ලෙස ඉඩම් හා වාරි භුක්ති ක්‍රම ඇති වීමක් හෝ ජනපද තුළ දක්නට නැත. තදබල ලෙස වාරි මාර්ග පද්ධති බිඳ වැටීමක් ගැනද අනාවරණය වී නැත. එහෙත් දක්නට ඇත්තේ ගොඩමඩ ඉඩම් වලින් ලැබෙන අස්වැන්න ප්‍රමාණය පවුලේ සාමාජිකයන් අතර බෙදී යෑමකි. එනිසා ජනපද ඉඩමකින් ලැබෙන ආදය මෙන් විශාල ජනපදික ජන සංඛ්‍යාවක් එදිනෙද යැපුම් මට්ටමක පවත්වා ගෙන යැමට පවුල් මට්ටමෙහි පවත්නා නිරන්තරයෙන් වැඩිවෙන පරිශ්‍රමයක් දක්නට ලැබේ.

එවැනි ආර්ථිකයක බිහිව ඇත්තේ, යැපුම් මට්ටම රඳවා ගැනීමට ගොඩනැගී ඇති නාමික ආර්ථික විවිධාංගිකරණයක් මිස ජනපද සැළසුම්කරුවන් හා විද්වතුන් බලාපොරොත්තු වන රක්ෂා හා ධනය වර්ධනය කරවන වෙළඳ පොලට යොමු වූ විවිධාංගිකරණයක් නොවේ. වැඩි පූර ආදයමක් ලබා ගැනීමට දෛනික වශයෙන් වැඩි පවුල් ශ්‍රමයක් හා වැඩි පවුල් ශ්‍රම කාලයක් යෙදවීමට ජනපදිකයන්ට සිදුව ඇත. එහෙත් වී ගොවිතැන මූල් වූ ආර්ථිකයේ අමතර ආදයම් මාර්ග විරල හෙයින් ද, එම ආදයම් මාර්ග බොහොමයක් ප්‍රධාන ආයෝජකයින් ස්වල්පයක් අතරින් පැන නැගුනු ඒකාධිකාරී තත්ත්වයකින් වැසී ඇති හෙයින්ද, ඉතිරි වී ඇති ආදයම් මාර්ග සඳහා සුළු ආයෝජකයින් ගේ තරඟය බහුල නිසාද, පවුල් ශ්‍රමය වැඩිපූර යෙද වීමෙන් ලැබෙන ආදයම ද අල්පය.

(3) ජනපදවල වාරි මාර්ග පද්ධතියෙන් පෝෂණය වන භූමි ප්‍රමාණය සීමිත නිසා ජනපද ආශ්‍රිත වාරි පෝෂිත කෘෂිකර්ම ක්ෂේත්‍රය වැඩි වන ජනගහනයට සකස් වන පරිදි පුළුල් කිරීම අසීරු කරුණකි. සැළසුම් අවස්ථාවේදීම වගා කිරීමට ඉතාම යෝග්‍ය භූමි ජනපද වාරි මාර්ග පද්ධතිය යටතට ගනු ලැබේ. මෙවැනි පසු බිමක් මත ජනපද තුළ අනවසරයෙන් අල්ලාගත් ඉඩම් ප්‍රමාණය, වැඩි වෙන ජන ගහනය නොයෙක් බාධක මධ්‍යයේ සිය ජීවන අවශ්‍යතා පිරිමැසීම සඳහා කෘෂිකර්ම භූමි ක්ෂේත්‍රය වැඩි කිරීමට ගත් ප්‍රයත්නයක ප්‍රතිඵලයක් සේ ගත හැකිය. ජනපද වාරි මාර්ග පද්ධතියට ද මේ පරිශ්‍රමයන් නිසා බලවත් හානියක් වූ බවක් දක්නට නැත. අනවසරයෙන් අල්ලා ගෙන ස්වෝත්සාහයෙන් වගා කරන මේ භූමි ජනපද භූමි ක්ෂේත්‍රයේ උපරිම ප්‍රසාරණ සීමාව ලෙස හැඳින් විය හැක. මෙයිනුදු ජනපද වල වැඩි වන ජන ගහනයට දීර්ඝ කාලීන වශයෙන් පිළිසරණයක් නොලැබේ.

(4) මේ හැර ජනපද ඉඩම් යම් ප්‍රමාණයක් ධනවත් ජන පදිකයන් හා ජනපදික නොවන පුද්ගලයන් විසින් පාලනය කෙරෙන බව නොයෙක් ක්ෂේත්‍ර පර්යේෂණ වාර්තා වලින් හා ජනපද ක්ෂේත්‍රය ගැන දනුම ඇත්තන්ගෙන් පැවසේ. සමහර වාර්තාවල දක්වෙන අන්දමට මහවැලි කලාපවල 50% වැඩි ඉඩම් ප්‍රමාණයක් කන්නයකට හෝ දෙකකට බදු දීම/ උගස් කිරීම මත ජනපදිකයන් නොවන අය අතට පත්ව ඇති බව පළවේ.

කිරිදි ඔය ජනපදය තුල පදිංචි කල ජන පදිකයන් තෝරා ගැනීමේ දී වූ අක්‍රමිකතා මධ්‍යයේ ජනපද ඉඩම් සැල කිය යුතු ප්‍රමාණයක් ඉඩම් ලැබීමට නුසුදුසු පුද්ගලයන්ට අත්පත් වී ඇත. ඩෙලිකා කොලනිය' 'ලාන්සර්' කොලනිය යන නම් වලින් ජනපදිකයන් හඳුන්වන ජනපද කොටස් හැරෙන්නට තවත් සැලකිය යුතු ප්‍රමාණයක් අඳේට උගසට හා බද්දට පිටස්තර අයට පත්ව ඇතැයි ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් හෙලිවේ.

ජනපද කරණුයේ මූල් අවධිවල ජන පදිකයන්හට මුහුණ පාන්නට වන ආර්ථික අස්ථායි තත්ත්වයන් යටතේ මෙලෙස විශාල ඉඩම ප්‍රමාණයක් පිටස්තර අය අතට පත් වූවත්, කල්යත්ම සිය පවුල් සාමාජිකයන් ගේ අවශ්‍යතාවයන් මත පවුලේ අයටම වැඩි වශයෙන් ඉඩම් වගාව අත්වන බවද ක්ෂේත්‍ර පරීක්ෂණ වලින් පෙනී යයි. මේ අනුව පවුලේ අය අතර අස්වැන්න බෙදුමක් හෝ ඉඩම් බෙදීමක් ව්‍යාප්ත වේ. මිණිපේ පරාක්‍රම සමුද්‍රය, පදවිය ආදී පැරණි ජනපද ගත් කල සම්පූර්ණ වගා භූමි ප්‍රමාණයෙන් 5 – 15% පමණ කොටසක් එවැනි පිටස්තර අයට වගා අයිතිවාසිකම් පැවරීම් වලට භාජනය වන බව පෙනී යයි. සෙස්ස තනි අයිතිය හා වගාව යටතේ පවුලේ අය අතර සිරිත් ප්‍රකාර බෙදී යන බව පර්යේෂණ වාර්තා වල දක්වේ.

## (ඊ) ජනපද තුළ සීමිත වෙළඳ හා කර්මාන්ත ආයෝජන

මුදල් හිඟකම ආදි ප්‍රශ්න බහුල වූ ජනපද පරිසරයක පවතින පුද්ගලික වෙළඳ ආයෝජන ජන පදිකයන් හා ජනපද ආර්ථිකය සූරා කෑමේ ලක්ෂණ පෙන්වයි. මහවැලිය වැනි නව සුවිශාල පරිමාණ ජනපද පද්ධතිවල තවමත් ගැඹුරට මුල් බැස නොගත් එහෙත් අනාගතයේදී ඇති විය හැකි එවැනි ලක්ෂණ අනෙක් සෑම ජනපදයකම වාගේ බහුලව දක්නට ලැබේ. මෑතකදී කරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ අනුව (ත්‍රිමල්ඃ 1987; වික්‍රමසේකර: 1982; සිරිවර්ධන: 1982) මහවැලි 'එච්' කලාපයේ ජන පදිකයන් බොහොමයක් මෙම පුද්ගලික වෙළඳුන් හට ණය ගැති වී ඇති බව පෙන්නුම් කරයි.

පෙර දක්වූ පරිදි ජනපද වල ආර්ථිකය මූලික වශයෙන් රඳා පවත්නේ හුදෙක් කෘෂිකර්මය විශේෂයෙන් – වී ගොවිතැන මතය. ජනපද තුළ වී ගොවිතැනෙන් ආරම්භ වී ඇති කර්මාන්ත බොහොමයක් කුඩා වී මෝල් වලට සීමා වේ. වෙළඳ ආයෝජනයන් සිල්ලර කඩ ආදී කුඩා සේවා ආයතන වලට සීමා වේ. ජනපදයක එවැනි ඒකක වුවද ඇත්තේ සීමිත ගණනකි.

මෙම සීමිත වෙළඳ හා කර්මාන්ත එක් අතකින් ජනපද ආර්ථිකයෙන් ජනිත වන ඉල්ලුමේ ප්‍රමාණය දක්වයි. සාමාන්‍ය ජනපදයක එම ඉල්ලුම කුඩා වන අතර ඒකාකාරී භාවයක් දක්වන බැව් ජනපදයේ දක්නට ඇති සීමිත වෙළඳ හා කර්මාන්ත ඒකක ප්‍රමාණයෙන් පෙනී

යයි. කෘෂි කර්මාන්තයෙන් පිට ආයෝජනයක් කිරීමට නව ආයෝජකයන් හට හැකියාවක් තිබුණත් එසේ කිරීමට නොහැකි වන්නේ එවැනි ආයෝජන අවස්ථා ජනපද ආර්ථිකය තුළ ඉතා අඩු තත්ත්වයක පවතින නිසා යැයි උපකල්පනය කළ හැක. තවද කෘෂි කර්මාන්තයෙන් පිට නව ආයෝජනයක් කිරීම නොහැකි තත්ත්වයක බොහෝ ජනපද ආර්ථික පරිසර සකස් වී ඇති නිසා, එවැනි ආයෝජනයක් කිරීමට හැකි අය ජනපද වලින් පිට නගරවල හා තදසන්න පෙදෙස් වල කර්මාන්ත සහ වෙළඳ සේවා ස්ථාන ආරම්භ කරති. මෙලෙස ජනපද දියුණුවට යෙදිය හැකි ජනපද ආර්ථික ක්‍රියාකාරිත්වය තුළින් ජනනය වන ආර්ථික ප්‍රාග්ධනය (කළමණාකාරිත්ව දක්ෂතාවයන් ඇතුළුව) පිටතට ගලා යාමක් පවතී.

ජනපද තුළින් පිටතට ගලා යන මෙම ප්‍රාග් ධනය පුද්ගලික වෙළඳුන් හා කර්මාන්තකරුවන් මගින් සිදුකෙරෙන ආයෝජනයන්ට සීමා වී නැත. බැංකු හා රජයට සම්බන්ධ වෙනත් ආයතන ද මෙම ක්‍රියාදමයට දයක වන හෙයින් සැලකිය යුතු ආර්ථික විවිධාංගීකරණයක් ජනපද තුළ ගොඩ නැගීමට ඇති ඉඩකඩ ඇහිරී යයි. ජනපද වලින් පිටත කෙරෙන මෙම ප්‍රති ආයෝජනයන් වැඩිවීම බොහෝ ජනපද වල දීර්ඝ කාලීන ලක්ෂණයක් ලෙස පෙනෙන්නට තිබෙන ආර්ථික ඒකාකාරී බව හා එහි වාසය කරන යම් යම් ජනපදික පවුල් අතර වැඩි වෙමින් පවතින යැපුම් මට්ටමේ හා ඊටත් පහළ දුගී ජීවන තත්ත්වයටද හේතු වන ප්‍රධාන සාධකයකි.

**(උ) නිත්‍ය හා සාපේක්ෂ දුගීබව**

නිත්‍ය දුගීබව යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනුයේ රටක සම්පූර්ණ ජනගහනයෙන් දුගී මට්ටමට පහළින් සිටින ජන අනුපාතයයි. [1] මසකට රු. 800 ක ගෘහ ආදයමක් මෙම දුගී මට්ටම ලෙස දුන් සැලකේ. 1988 මැයි මාසයේදී නිකුත් කරන ලද දුගී හා දුප්පත් බව අඩුකර ලීමට පිළිවෙත් සාකච්ඡා කර ඇති රජයේ ඉහළ මට්ටමේ නිල වාර්තාවක් අනුව ලංකාවේ ජන ගහනයෙන් 50% ට වැඩි ප්‍රමාණයක් රජය පිළිගත් දුගී මට්ටමට පහළින් ආදයම් ලබමින්

> **කිරිදිඹය ජනපදයේ හෙක්ටයාරයක වී නිෂ්පාදනය 1976/77 සිට 1985/86 කාලය අතර 5% ක වේගයකින් වැඩි වූ අතර එම කාලය තුළම නිෂ්පාදන වියදම වසරකට 9% ක වේගයකින් වැඩි වී ඇත. ...ජ ...ා වී ගොවිතැනෙන් ලැබෙන ශුද්ධ ලාභය පහත වැටෙමින් පවතී.**

ජීවත් වන බැව් පෙනී යයි. මේ හැර ජනගහනයෙන් 25% පමණ අධි ඌණ පෝෂණ තත්ත්වයකින් පෙළෙන බැව්ද එම වාර්තාව දක්වයි. ගෘහ ජනගහනයෙන් 12% පමණ සිය සම්පූර්ණ ආදයමෙන් 80% ට වඩා ප්‍රමාණයක් ආහාර සඳහා වැය කරන බවක් ද පෙන්වා දී ඇත. ඉහතකී ජන කොටස් දුගී රේඛාවෙන් පහළ අන්ත දුගී තත්ත්වයේ ජීවත් වන්නන් ලෙස ගැනේ.

ජනපදවල නිත්‍ය දුගී භාවය රටෙහි පොදු තත්ත්වයට වඩා අඩු මට්ටමක තුනත් රජයෙන් මේ දක්වා කර ඇති සුවිශාල ප්‍රාග්ධන ආයෝජන ප්‍රමාණය අනුව බලන කළ නිත්‍ය දුගී තත්ත්වයක් ජනපද තුළ පැන නැගීම ඉතා බැරෑරුම් ප්‍රශ්නයකි. මෑතක දී කරන ලද පර්යේෂණයක් අනුව (වනිගරත්න: 1987 පිටු 40-41) අනුව ජනපද තුළ නිත්‍ය දුගී බවෙන් පෙළෙන ජන කොටස් ජනපද ජනගහනයෙන් 34% පමණ වන බැව් දක්වා ඇත. 1979 දී ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අනුග්‍රහය මත මහවැලි 'එච්' කලාපයේ කරන ලද පෝෂණය සම්බන්ධ සමීක්ෂණ වාර්තාවක් අනුව ජනපදිකයන්ගෙන් 33% ට ආසන්න ප්‍රමාණයක් මන්ද පෝෂණයෙන් පෙළෙන බැව් දක්වා ඇත. 50% වැඩි ප්‍රමාණයක් දුගී මට්ටමෙන් පහළ ඇති බව 1983/84 දී කරන ලද සමීක්ෂණයකින් (සිල්වා: 1986: දත්ත වගු 1 )පෙනී යයි. මෙවැනි ජන පදික ප්‍රමාණයක් දුගී මට්ටමට පහළින් වැටීමෙන් පෙනී යන්නේ ජනගහනය වැඩිවීම, සීමිත ඉඩම් ප්‍රමාණය, නිෂ්පාදන, කෘෂි ද්‍රව්‍ය අලෙවි කිරීම සම්බන්ධ ප්‍රශ්න හා රැකියා හා ආදයම් මාර්ග පටුවීම සම්බන්ධ ප්‍රශ්න ආදී නොයෙක් බාධා මධ්‍යයේ රජය බලාපොරොත්තු වූ සමෘද්ධියක් ජන පද තුළ ගොඩ නැගී නැති බවය.

සාපේක්ෂ දුගීබව යනුවෙන් හඳුන්වනුයේ ආදයම් පංති අතර ඇති ආදයම් පරතරයයි. ජනපද තුළ මෙම ආදයම් පරතරය ගැටළු තත්ත්වයක පවතී. ජනපද තුළ පහල ආදයම් ලබන 30% ජන කොටස ලබන්නේ ජනපද ආදයමෙන් 11% ක් බවත්, ඉහල ආදයම් ලබන 10% ජන කොටස ආදයම් වලින් 27% ක් ලබාගන්න බව ඉහත සඳහන් වාර්තාව දක්වයි.

මෙයින් පෙනී යන්නේ රජය මගින් සමාන ඉඩම් ප්‍රමාණය හා සමාන සේවා ඒ ඒජනපද වල පදිංචි කරුවන්ට ලබා දුන්නත් කල් යෑමේ දී සාපේක්ෂ දුගී බව සැලකිය යුතු ප්‍රමාණයකින් එම ජනපද තුළත් වර්ධනය වී ඇති බවය. මේ අනුව ජනපද තුළ ඇති වූ කෘෂි නිෂ්පාදන වර්ධනයෙන් වැඩි වාසි ජනපද ආර්ථිකයේ ඉහල ආදයම් මට්ටම් වල ජන පදිකයන් හා වෙළඳුන් ආදී ජන කොටස් ලැබූ බවත්, ඒ අනුව පහල ආදයම් ලබන ජන පදිකයන්ගේ තත්ත්වය හීනව ගොස් ඇති බවක් සංඛ්‍යා ලේඛණ වලින් පෙනේ. වනිගරත්න පර්යේෂණ වාර්තාව අනුව 1976/80 සහ 1981/86 කාල යුගලය අතර ජනපද තුළ දුගී බව 19% කින් පමණ අඩු වී ඇති බැව්ද දක්වා ඇත. පහල ආදයම් ලබන ජන කොටස් තුළ පාරම්පරික සිරිත් අනුව කෘෂි පලදාව හා වෙනත් ද්‍රව්‍ය හා ආදයම් බෙදී යෑම නිසාද ආහාර මුද්දර හා වෙනත් රජයේ සහනාධාර නිසාද, නිත්‍ය දුගී බවට වැටෙමින් පවතින සංඛ්‍යාව තර මක් දුරට ජනපද තුළ අඩු කර ගෙන තිබෙන බවත් එම සංඛ්‍යා තුළින් උප කල්පනය කළ හැක.

14 පිටුවට →

(11 වන පිටුවෙන්)

**4. නිගමන**

ජනපද පිහිටුවීමෙන් ලක්දිව ඉඩම් රහිත ජනගහනයට සැලකිය යුතු සෙතක් සිදුවී ඇත. රටෙහි මූලික ආහාරය නිපද වීමට ජනපද වලින් විශාල රුකුලක් ද සිදු වී ඇත. වියළි කලාපීය ප්‍රදේශ වලට වාරි මාර්ග, මහා මාර්ග හා නොයෙක් සේවා පහසුකම් තුළින් මහත් සේවාවක් ද වී ඇත. ප්‍රාදේශීය සංවර්ධන ක්‍රමයක් ලෙස ජනපද පිහිටුවීම ලංකාවේ ප්‍රධාන තැනක් ගනී. ග්‍රාමීය ජනගහණය



නගර කරා සංක්‍රමණයවීම මෙමගින් අඩුකර ඇත. එමගින් සංක්‍රමණික ජන ගහණ තදබදය නිසා නගර තුළ ඇතිවන ප්‍රශ්න තරමක් දුරට වලක්වා ඇත.

එහෙත් මෙම ජනපද තුළ පවතින සීමිත ඉඩම් ප්‍රමාණය මත වැඩි වෙන ජන ගහනයට අවශ්‍ය රැකියා, ආදායම් මාර්ග හා ආහාර සැපයීමට වී ගොවි තැනෙහි එල්බ ඇති ආර්ථිකයෙන් හැකිවී නැත. රටෙහි ආර්ථික උද්ධමනය හා වැඩි වෙමින් පවතින නිෂ්පාදන වියදම් නිසා ගොවීන්ට ලැබෙන ශුද්ධ ආදයම ක්‍රමයෙන් හීන වී ඇත. මෙලෙස ජනගහනය වැඩි වෙද්දී නව තාක්ෂණ භාවිතා කිරීම නිසා නිෂ්පාදනය සූක්ෂම වුවත් ශ්‍රම නාස්තියක් පවතී. කුලී ශ්‍රමයෙන් ලැබෙන ආදයම ද ඒකකාරී මට්ටමක පවතී. ජනපද තුළ පැන නැගී ඇති නිත්‍ය හා සාපේක්ෂ දුගී බව අඩු කර ලීමට වර්තමාන ජනපද ආර්ථිකය අපොහොසත් වී ඇත.

එක් අතකින් ජනපද තුළ රක්ෂා හා ආදයම් වැඩි කරන නව ආයෝජන බිහි කිරීමට එහි වී ගොවිතැනට සීමා වූ ආර්ථිකය හා ඒ සම්බන්ධ කර්මාන්ත හා වෙළඳ ''ඒකාධිකාරය'' ඉඩ නොදේ. අනෙක් අතට ජනගහනයෙන් යැපුම් හා දුගී මට්ටම් මත පවතින ජනපද ජන සංඛ්‍යාව විශාල හෙයින් නව භාණ්ඩ හා නව ආයෝජන වලට ඇති ඉල්ලුමත් දුර්වල තත්ත්වයක පවතී. ණයගැති බව හා පවුල් මට්ටමේ පවතින විශාල යැපුම් ජනගහණය ජනපදික ආර්ථිකය පහත බැසීමට තුඩු දෙන තවත් කරුණු වේ. නිෂ්පාදනය වැඩි වුවත් එයින් ලැබෙන ලාභය අඩු තත්ත්වයේ පැවතීම හා ලබන ආදයමෙන් විශාල ප්‍රමාණයක් ප්‍රාග්ධනය වැඩි කර ගැනීම උදෙසා නොව මූලික ආහාර පාන ලබා ගැනීම සඳහා වැයවීමද ජනපද ආර්ථික පරිහානියේ තවත් මුහුණුවරකි. ජනපදවල වද පවතින ආර්ථික හා සාමාජික ගැටළු වල බැරෑරුම්කම ගම්වල පවතින තත්ත්වයට බෙහෙවින් සමානය. ගම් තුළ පවතින වැඩිවෙන ජනගහනයට අවශ්‍ය ඉඩම්, රැකියා හා ආදයම් මාර්ග නැතිකම හා සම්බන්ධ ''දුගී–දුප්පත්කම'' විසඳීම උදෙසා නිර්මාණය කළ ජනපද තුළ එවැනිම තත්ත්වයක් බිහිවෙමින් පවතින බැව් පෙනී යයි.

මෙම තත්ත්වයෙන් ජනපද මුදගැනීමට ගතහැකි පිළිවෙත් රාශියක් ඇත. එයින් සමහරෙක් නම් :

1. වී ගොවිතැනට නැඹුරු වූ ජනපද ආර්ථිකයේ වී ගොවිතැනේ කාල සටහන අනුව කාලීන රැකියා හිඟ බවක් හා කාලීන ආදයම මාර්ග විරල බවක් දක්නට තිබේ. ජනපද කෘෂි සමාජයේ දුප්පත් හා දුගී බව වැඩි වෙමින් පැවතීමට මෙය ප්‍රධාන සාධකයකි. මෙය මහ හැරවීමට අවුරුද්ද තුළ ආදයම් ලබාදෙන කෙටිකාලීන භෝග වර්ග හා භෝගව[illegible] බාහිර කෘෂි විවිධාංගීකරණයක් අත්‍යාව[illegible] යයි. ඒ ඒ භෝගයෙන් ලැබෙන ආදයම කුඩා වුවත් දෛනික අවශ්‍යතා එමගින් සපිරිලන බැවින් වී ගොවිතැන වැනි දීර්ඝ කාලීන (මාස 3–4 ට පසු) ආදයම් ලබන කෘෂි කටයුතු වලින් ලැබෙන ධනය වෙනත් ඵලදායී ආයෝජනයක් කරා යෙදවීමට ගොවීන්ට හැකි වෙනු ඇත.

2. ජනපද ගොවීන් හුදකලා නිෂ්පාදකයින් හා අලෙවි කරුවන් වීම නිසා එයින් ඇතිවන තරඟයෙන් ද්‍රව්‍ය හා නිෂ්පාදන මිල තමන්ට ලාභදායී තත්ත්වයට ගෙන ඒමට හැකියාවක් ගොවීන් තුළ නැත. බොහෝ විට කඩ කාරයින්, තොග වෙළඳකරුවන් මිල පාලනය කරති. මෙය මහ හැරවීමට ජනපද ගොවීන් අතර සාමූහික ඉල්ලුමක් හා අලෙවියක් ඇති කළ හැ[illegible] විධාන ආරම්භ කළ හොත් එමගින් විශාල ලාභ සෑම දෙනාටම පොදු වේ ගත හැක.

3. රට තුළ හා රටින් පිට කෘෂි නිෂ්පාදනයන් වලට ලැබෙන නිතර වෙනස්වන ඉල්ලුම හා මිල ප්‍රමාණයන් ගැන මහා අවබෝධයක් ජනපද ගොවීන්ට ලබා දෙන මාර්ග පිළියෙළ කළ හැකි ජාතික සංවිධානයක් අත්‍යාවශ්‍යවේ. මෙවැනි අවබෝධයක් නැතිව ගොවීන් බෝග විවිධාංගීකරණයට යොමු කළ නොහැකිය.

4. ජනපද තුළ වැඩි වන ජනගහනයට රක්ෂා හා ආදායම් මාර්ග සැපයීම කෘෂිකර්මය තුළින් ම සිදුකල හැක්කේ ජනපද කෘෂිකර්මය විවිධාංගි කළ

හොත් පමණි. මෙහි දී බෝග, සත්ත්ව පාලනය හා කෘෂි අමු ද්‍රව්‍ය යොදවන කර්මාන්ත හා අදාල සේවා ගොඩ නැගීම අවශ්‍ය වේ. මෙවැනි ගොඩ නැඟීමකට අවශ්‍ය පුද්ගලික ආයෝජන වැඩි කරවා ගැනීමට ඊට අදාල පහසුකම්–විදුලිය, මාර්ග පරිවහන, පණිවිඩ පහසුකම් ඇති කළ යුතුය.

5. ජනපද සංවර්ධනය කෘෂි කර්මාන්තයෙන් ආරම්භ කළත් එහි අනාගතය රඳා පවත්නේ ඒ හා සමාන හෝ ඊට වඩා දියුණු නිෂ්පාදන කර්මාන්ත සංවර්ධනයක් ජනපද හා ජනපද තදාසන්න පෙදෙස් වල ආරම්භ කළහොත් පමණි. සීමාසහිත භූමියක් මත වැඩිවෙන ජනගහනයකට අනාගතයේදී අවශ්‍ය ආහාර, රක්ෂා, හා ආදායම් [illegible] කෘෂිකර්ම විවිධාංගීකරණ පදනමක් මතම ඉෂ්ඨ කරගත නොහැකිය, දීර්ඝ කාලීන ඉඩම් පරිහරණයේ දී එම ඉඩම් කැබිලි කරණයට භාජනය විය හැක. කෘෂි දියුණුව රඳා පවත්නේ ඒ හා සමාන දියුණුවන සේවා හා කර්මාන්ත අංශ අතර ශ්‍රම, ආයෝජන, අමුද්‍රව්‍ය හා නිශ්පාදන භාණ්ඩ හුවමාරු සම්බන්දතා මතය. එම නිසා දීර්ඝ කාලීන වශයෙන් ජනපද භූමිවල අඛණ්ඩතාවය හා ඒ සම්බන්ධ බෙදා දුන් ඉඩම්වල ආර්ථික ශක්‍යතාවය රැක ගැනීමට නම් වැඩිවෙන ජනගහනය ඉඩම් තුළින් සිය අවශ්‍යතා පිරිමැස්මට පෙළඹීම වැළැක්විය යුතුය. මෙය ඉටු කර ගත හැක්කේ කෘෂිකර්මයෙන් පිට රැකියා ජනිත කරන ආර්ථික පදනමක් ජනපද හා ජනපද තදාසන්න ප්‍රදේශ තුළ ඇති කිරීමෙනි.

මෙවැනි ආර්ථික පදනමක් ඇති කිරීමට අවශ්‍ය මූලික පහසුකම් ජනපද හා එහි පරිසරයේ තිබිය යුතුය. අවශ්‍ය මූලික පහසුකම් කිහිපයක් නම් විදුලිය, සංනිවේදන හා ගමනාගමන පහසුකම්ය. මෙවැනි පහසුකම් නැති ජනපද පරිසරයක නිෂ්පාදන කර්මාන්තකරණයක් හෝ පුළුල් ආර්ථික දියුණුවක් ඇතිවිය නොහැක.

6. ලංකාවේ ජනපද බොහොමයක් සැලසුම් කර ඇත්තේ හුදකලා සංවර්ධන ඒකකයන් ලෙසය. මේ අනුව ජනපද තුළ සංවර්ධනයක් බලාපොරොත්තු වෙන් කරන විශාල ආයෝජනයන් බොහෝ විට ජනපද ව්‍යාප්ති බිම් ප්‍රමාණයට පමණක් සීමා වේ. එහෙත් ජනපද ආර්ථිකයේ දියුණුව රැඳී පවත්නේ



එම ජනපදය හා අවට ප්‍රදේශය අතර පවතින ආයෝජන හා සම්පත් (ප්‍රාග්ධන ආයෝජන, ශ්‍රම, අමුද්‍රව්‍ය, නිෂ්පාදන හා අලෙවි භාණ්ඩ) ගලනය මතය. එහි විෂමතාවයන් ඇතිවීම නිසා ජනපද ආර්ථිකය පමණක් නොව අවට පෙදෙස් වල ආර්ථිකයන්ද බොහෝ විට ඌණ සංවර්ධිත අවස්ථාවක පවතී. මෙය වැළැක්වීමට ජනපද ආර්ථික සැලසුම් කිරීමේ දී ජනපද හුදකලා පද්ධති ලෙස නොගෙන සම්පූර්ණ ප්‍රාදේශීය ආර්ථික පද්ධතියක ප්‍රධාන අංශයක් ලෙස සලකා සංවර්ධන කට යුතු සකස් කර ගත යුතුය.

දැනට මේ සම්බන්ධයෙන් නොයෙක් මත ප්‍රකාශ කරතත්, සීමිත අවධානයක් ජනපද ආර්ථික සැලසුම් කිරීමේ දී යොමු කරතත්, සැලකිය යුතු දීර්ඝකාලීන ජනපද සම්බන්ධ ප්‍රාදේශීය සංවර්ධන සැලැසුමක් අද දක්වා දියත් කර නොමැත. මෙවැනි සැළැසුමක් අනුව ආරම්භයේ සිටම සංවර්ධන වැඩ කටයුතු ක්‍රියාත්මක නොකිරීම නිසා වියළි කලාපයේ අද දක්නට ඇත්තේ ''දුගී–දුප්පත්'' බව වැඩිවෙමින් පවතින ජනපද හා එම ජනපද සම්බන්ධ ඌණ සංවර්ධිත අවස්ථාවක පවතින ජනපද ආශ්‍රිත ප්‍රදේශයන් ය.

7. වන ජනපද ආරම්භ කිරීමට විශාල ආයෝජනයක් තව දුරටත් යෙදීමට වඩා දැනට ආරම්භ කර ඇති ජනපද වෙනත් ආර්ථික මුහුණු වරකින් ප්‍රති සැලසුම් කිරීමට රජයේ ආයෝජනයන් යොමු කිරීම වියළි කලාපයේ වර්තමාන හා අනාගත ආර්ථික, සාමාජික හා දේශපාලනක පරිහානියක් ඇති වීම වැළැක්වීමට ගත හැකි කාලෝචිත පියවරකි.

මෙම ප්‍රති සැලසුම් කිරීමේදී ජන පද හා තදසන්න ප්‍රදේශ වල පවතින ගම් හා නගර ආර්ථිකයන් ද වෙන් වෙන් වශයෙන් නොව එකම ආර්ථික හා සමාජීය පද්ධතියක කොටස් ලෙස සලකා සමස්ථයක් ලෙසට ගැනීම යෙහෙකි. මෙබඳු ප්‍රති සැලසුමක අනාගත බලාපොරොත්තුව විය යුත්තේ ලක්දිව තුළ සමබර සංවර්ධනයක් ජනිත කර වීමයි. ජනපද, ගම්, නගර වශයෙන් වෙන් වෙන් ලෙස දැනට සිදුවන සංවර්ධන ක්‍රියාවලිය වෙනුවට මේ සියල්ල අතර සංවර්ධනයේ සම බර තාවයක් හා අන්තර් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම රටෙහි අනාගත ආර්ථික දියුණුව වැඩි කර ගත හැකි මාර්ගයකි. මෙවැනි තත්වයක් ලබා ගැනීමට අවශ්‍ය සියලු සම්පත් (දැනුම, ශ්‍රම ශක්තිය, ආයෝජන හැකියාව හා දේශපාලනික ශක්තිය) අප සතු ව ඇත. මේවා විදේශ වලින් සෙවීමට අවශ්‍ය නැත. අවශ්‍ය වන්නේ මෙම පරිශ්‍රමය ආරම්භ කිරීමට රජයක තිබිය යුතු ස්ථිර අධිෂ්ඨානය හා කැප වීමයි.